දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
E-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதாரம் அமைச்சு
Ministry of Health

මගේ අංකය )
எனது இல. )
My No. ) CF/EXU/02/2022

ඔබේ අංකය )
உமது இல. )
Your No. )

දිනය ) 2022/07/26
திகதி )
Date )

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02 - 66/2022

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

අදාළ ආයතන ප්‍රධානින් වෙත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයට අයත් වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ වාග් චිකිත්සක තනතුරේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

වාග් චිකිත්සක තනතුරේ II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත. **(විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් නිකුත් කරනු ලැබේ).**

**02 සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ වාග් චිකිත්සක තනතුරේ II ශ්‍රේණියට උසස්වීමක් ලබා මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පමණි.

සැ.යු -:

- **2022/09/09** දිනට හෝ ඊට පෙර II ශ්‍රේණියට උසස් කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.
- පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්ක්ෂමතා කඩයිම් පරීක්ෂණයෙන් සමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි යන ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.
- පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්ක්ෂමතා කඩයිම් පරීක්ෂණයෙන් අසමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ප්‍රශ්න පත්‍ර තුන සඳහාම පෙනී සිටිය යුතුය.

**03 අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් **කොළඹ – 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂ (විභාග)** වෙත **2022/09/09** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද **රු. 45.00ක් වටිනා මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලියුම් කවර 02ක්** එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද, නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 දක්වාත් දෙවන පිටුවේ අංක 5 සිට 9 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.***


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

**04 විභාග ගාස්තු**

**4.1** විභාගයට පළමු වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25.00 බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

**4.2** කිසිඳු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

**05 විභාගයට ඇතුලත් කර ගැනීම**

**5.1** පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**5.2** විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකිවිලි අතුරින් එකක් භාරගනු ලැබේ.

[අ] ජාතික හැඳුනුම්පත
[ආ] සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත
[ඇ] වලංගු රියදුරු බලපත්‍රය
[ඈ] වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06 විභාග පරිපාටිය**

මෙම විභාගය **කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සහ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින්** සමන්විත වන අතර, කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය - **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති** සහ මුදල් රෙගුලාසි යන රචනා ප්‍රශ්න පත්‍ර දෙකකින්ද **දෙපාර්තමේන්තු පරීක්ෂණය - විෂයානුබද්ධ ලිඛිත, වාචික හා ප්‍රායෝගික** යන පරීක්ෂණ වලින් සමන්විතය.

**07 විෂය නිර්දේශය**

**7.1 කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය**

මෙම ප්‍රශ්න පත්‍ර දෙකම රචනා මාදිලියේ ප්‍රශ්න 07 බැගින් සමන්විත වන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. කාලය පැය 02 බැගින් හිමි වේ.

**7.1.1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.

ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ:

| | | | |
|---|---|---|---|
| XV | වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම |
| XVI | වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII | වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV | වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV | වන පරිච්ඡේදය | - | වෘත්තිය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ |
| XXVII | වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII | වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXX | වන පරිච්ඡේදය | - | රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII | වන පරිච්ඡේදය | - | නීති උපදෙස් සහ නීති ක්‍රියා මාර්ග |
| XLVII | වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම හා විනය |
| XLVIII | වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

7.1.2. මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ:

VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම් (මු. රෙ. 315 සිට මු. රෙ. 396 දක්වා)

XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා: සැපයීම්/මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර වීම (මු. රෙ. 708 සිට මු. රෙ. 755 දක්වා)

7.2 දෙපාර්තමේන්තු පරීක්ෂණය

7.2.1. විෂයානුබද්ධ ලිඛිත

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 08කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. කාලය පැය 03 කි.

7.2.2. විෂයානුබද්ධ වාචික

විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේ දී මුහුණපාන ගැටලු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. මෙම පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ලැබේ. සමත්වීම සඳහා ලකුණු 40ක් ලබා ගත යුතුය. කාලය විනාඩි 15 කි.

7.2.3. විෂයානුබද්ධ ප්‍රායෝගික

විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. මෙම පරීක්ෂණය සඳහා ලකුණු 100ක් ලැබේ. සමත්වීම සඳහා ලකුණු 40ක් ලබා ගත යුතුය. කාලය පරීක්ෂණය අනුව තීරණය වේ.

08 විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09 කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. (මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

**Web Path :- www.health.gov.lk → Staff Access → Admin → Circulars**

සැ.යු. විභාග චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

**EXU**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

# ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයට අයත් වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ වාග් චිකිත්සක තනතුරේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022**

**(පළමු වාරය)**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( සිංහලෙන් ) : ..............................................................................

..............................................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) :

(iii) මුලකුරු සමඟ නම ( සිංහලෙන් ) : ..............................................................................

..............................................................................................................................

(iv) මුලකුරු සමඟ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

(ආ) i. අදාළ ශ්‍රේණියට පත්වීමේ දිනය සහ පත්වීම් ලිපි අංකය ..............................................

ii. දැනට ලබන වාර්ෂික වැටුප ..............................................................................

iii. ජංගම දුරකථන අංකය

iv. ජාතික හැඳුනුම්පත් අංකය

v. විද්‍යුත් ලිපිනය ..............................................................................

02 ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති | | විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණය | |
| මුදල් රෙගුලාසි | | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | |
| | | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | |

03 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්) ..............................................................................

(ඉංග්‍රීසියෙන්) ..............................................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ

| | |
|---|---|
| මධ්‍ය අමාත්‍යාංශයට | |
| පළාත් සභාවට | |

(ඇ) පළාත් සභාවට නම් අදාළ පළාත ..............................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය ..............................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 45.00ක මුද්දර ඇලවූ ලියුම් කවර දෙකක් අයදුම්පත්‍රයට අමුණා ලද්දේද? ..............................................

(ඊ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..............................................................................

..............................................................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..............................................................................

..............................................................................................................................

04 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..............................................................................

05 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..............................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද? ......................................................................

| |
|---|
| මුද්දර කොටුව |

---

06 අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු ...... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මෙම එකඟ වන බවත් සහතික කරමි / නොවන බවත් මෙයින් සහතික කරමි.

දිනය .........................  ...............................................

අයදුම්කරුගේ අත්සන

---

07 පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිණියගේ සහතිකය

මෙම අයදුම්පත් භාරගන්න අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය .........................  ........................................

නම සහ අත්සන

---

08 ආයතන ප්‍රධානියාගේ සහතිකය

.............................................................. මහතා / මහත්මිය / මෙනවිය මා හොඳින් දන්නා අයකු වන අතර මෙම විභාගයට පෙනී සිටින්නේ **ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන** බවටද රු .................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම් පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය .........................  ...............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

---

09 විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

............................................................ මහතා / මහත්මිය / මෙනවිය, **II ශ්‍රේණියේ වෛද්‍ය විකිත්සක** නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත් අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .........................  ...........................................

විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(* - අනවශ්‍ය කොටස් කපා හරින්න.)